අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2007 අගෝස්තු

G. C. E. (Adv. Level) Examination, August 2007

කෘෂි විද්‍යාව I - පැය දෙකයි

Agricultural Science I - Two hours

ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.

සැලකිය යුතුයි :

☆ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
☆ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
☆ උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිලිමත් ව කියවන්න.
☆ 1 සිට 60 තෙක් වූ එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරා, එය උත්තර පත්‍රයේ දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (×) යොදා දක්වන්න.

• ශාක සෛලයක ඇති විවිධ කොටස්වල ක්‍රියාකාරිත්වය පහත ප්‍රකාශවලින් දැක්වේ. අංක **1** සහ **2** ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා එම ප්‍රකාශ උපයෝගී කරගන්න.

(A) විෂමාකාර පාරගම්‍යතාව (differential permeable) සහිත ය.
(B) ඇමයිනෝ අම්ල ප්‍රෝටීන බවට බහුඅවයවීකරණය වේ.
(C) සෛලයේ ප්‍රවේණික ද්‍රව්‍ය ගබඩා කර ඇත.
(D) ශාකයේ සැකිල්ල ලෙස ක්‍රියා කරයි.
(E) සෛලයට නිශ්චිත හැඩයක් ලබා දෙයි.
(F) සෛලයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධීකරණය කරයි.

1. සෛල බිත්තියේ ප්‍රධාන කාර්යයන් වනුයේ
(1) A හා B පමණි. (2) B හා C පමණි. (3) C හා D පමණි.
(4) D හා E පමණි. (5) E හා F පමණි.

2. රයිබොසෝමයේ ප්‍රධාන කාර්යය වනුයේ
(1) A පමණි. (2) B පමණි. (3) C පමණි. (4) D පමණි. (5) E පමණි.

3. බෝගයක "පාරිභෝගික ජල භාවිතාව" ලෙස සලකනු ලබන්නේ
(1) බෝගයේ උත්ස්වේදනය වේ.
(2) බෝග ක්ෂේත්‍රයේ වාෂ්පීකරණය වේ.
(3) උත්ස්වේදනය හා ශාකයේ වෙනත් කායික ක්‍රියාවලි සඳහා භාවිත කෙරෙන ජලය ප්‍රමාණය වේ.
(4) බෝග ක්ෂේත්‍රයේ වාෂ්පීකරණය හා කාන්දුවන (infiltration) ජලය ප්‍රමාණය වේ.
(5) වාෂ්පීකරණ උත්ස්වේදනය හා ශාකයේ වෙනත් කායික ක්‍රියාවලි සඳහා භාවිත කෙරෙන ජලය ප්‍රමාණය වේ.

4. ශිෂ්‍යයකුට තමා සතු බීජ නියැදියක ජීව්‍යතාව පරීක්ෂා කිරීමට අවශ්‍ය විය. එහෙත් බීජ නියැදියේ සුප්තතාව පිළිබඳ කිසිම තොරතුරක් ඔහු සතුව නොතිබිණි. මෙම බීජ නියැදියේ ජීව්‍යතාව පරීක්ෂා කිරීමට වඩාත් ම සුදුසු ක්‍රමය වනුයේ
(1) පෙට්‍රි දීසි ක්‍රමයයි. (2) රැග්ඩෝල් ක්‍රමයයි. (3) තවාන් පෙට්ටි ක්‍රමයයි.
(4) උණුසුම් ජල ප්‍රතිකාර ක්‍රමයයි. (5) ටෙට්‍රාසෝලියම් ක්ලෝරයිඩ් ක්‍රමයයි.

5. පසට කොම්පෝස්ට් එකතු කිරීම මගින්
(1) පසේ ක්ෂුද්‍ර ජීවී ගහණය අඩු වේ.
(2) රසායනික පොහොර හා මිශ්‍ර වී ශාකයට හානිකර බලපෑම් ඇති වේ.
(3) බෝග ක්ෂේත්‍රයට රෝග හා පළිබෝධ ඇතුළු වේ.
(4) රසායනික පොහොර භාවිත කාර්යක්ෂමතාව වැඩි වේ.
(5) බෝග ක්ෂේත්‍රයේ වල් පැළ ගහණය වැඩි වේ.

6. ශිෂ්‍යයකුට බීජ නියැදියක තෙතමන ප්‍රතිශතය නිර්ණය කිරීමට අවශ්‍ය විය. ඔහු පහත නිරීක්ෂණ සිදු කළේ ය.
බීජ නියැදියේ ආරම්භක බර = 300 g
නියත බරකට වියළීමෙන් පසු බීජ නියැදියේ බර = 270 g
බීජ නියැදියේ තෙතමන ප්‍රතිශතය වනුයේ
(1) 10.0% (2) 11.1% (3) 30.0% (4) 60.0% (5) 90.0%

7. බිම් සැකසීමේ දී තැටි පෝරුව ප්‍රධාන වශයෙන් භාවිත වනුයේ
(1) ප්‍රාථමික බිම් සැකසීමේ (primary tillage) දී ය.
(2) යටි පස ඇවිස්සීමේ (sub soiling) දී ය.
(3) ද්විතීයික බිම් සැකසීමේ (secondary tillage) දී ය.
(4) ශුන්‍ය බිම් සැකසීමේ (zero tillage) දී ය.
(5) අවම බිම් සැකසීමේ (minimum tillage) දී ය.

www.apepanthiya.lk

8. පහත ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
   (1) හොඳ වාතනයක් සහිත පසෙහි දෘශ්‍ය ඝනත්වය අඩු ය.
   (2) බිම් සැකසීම සැමවිටම දෘශ්‍ය ඝනත්වය වැඩි කරයි.
   (3) පසෙහි ජලය රඳ සිටීමේ ධාරිතාව කෙරෙහි දෘශ්‍ය ඝනත්වයෙහි බලපෑමක් නැත.
   (4) සාමාන්‍යයෙන් තද වර්ණයෙන් යුත් පස්වල දෘශ්‍ය ඝනත්වය වැඩි ය.
   (5) කණිකාමය ව්‍යුහයක් සහිත පසෙහි දෘශ්‍ය ඝනත්වය වැඩි ය.

9. ශිෂ්‍යයෙක් එක්තරා ශාකයක පුෂ්පයකින් එකතු කරගත් පරාග, එම ශාකයේ ම වෙනත් පුෂ්පයක කලංකය මත පරෙස්සමෙන් තැන්පත් කළේ ය. මෙම ක්‍රියාවලිය වඩාත් හොඳින් විස්තර කළ හැක්කේ
   (1) ස්ව සංසේචනය ලෙස ය. (2) පර සංසේචනය ලෙස ය. (3) ස්ව පරාගනය ලෙස ය.
   (4) පර පරාගනය ලෙස ය. (5) දෙමුහුම්කරණය ලෙස ය.

10. MS (Murashige and Skoog) මාධ්‍යය සලකනු ලබන්නේ
   (1) දිලීර නාශකයක් ලෙස ය. (2) කෘමි නාශකයක් ලෙස ය.
   (3) පටක රෝපණ මාධ්‍යයක් ලෙස ය. (4) ශාක වර්ධන යාමකයක් ලෙස ය.
   (5) දියර පොහොරක් ලෙස ය.

• අංක 11 හා 12 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත රූප සටහන උපයෝගී කර ගන්න.

පාංශු ජල වර්ගීකරණය



11. ඉහත රූප සටහනෙහි 'A' කලාපයෙන් දැක්වෙන්නේ
   (1) ජලාකර්ෂක ජලයයි. (2) කේශාකර්ෂණ ජලයයි. (3) ගුරුත්වාකර්ෂණ ජලයයි.
   (4) ලබාගත හැකි ජලයයි. (5) අතිරේක ජලයයි.

12. හොඳ ජලවහන තත්ත්වයක් යටතේ පසෙන් ඉවත්වන ජලය වනුයේ
   (1) A, B සහ C පමණකි. (2) B, C සහ D පමණකි. (3) B හා C පමණකි.
   (4) C හා D පමණකි. (5) D පමණකි.

13. බිම් සැකසීමේ එක්තරා ක්‍රමයක දී පාත්ති සැකසීමකින් තොරව, බීජය තැන්පත් කිරීම සඳහා භූමියේ සිදුරක් පමණක් සාදන ලදී. මෙය හොඳින් ම විස්තර කළ හැක්කේ
   (1) ප්‍රාථමික බිම් සැකසීම ලෙස ය. (2) ද්විතීයික බිම් සැකසීම ලෙස ය.
   (3) අවම බිම් සැකසීම ලෙස ය. (4) ශූන්‍ය බිම් සැකසීම ලෙස ය.
   (5) අතුරු යත්ගෑම ලෙස ය.

14. ගොවියෙක් වියළි කලාපයේ ඉඩමක බහුවාර්ෂික පලතුරු බෝග වගා කිරීමට සැලසුම් කරයි. මෙම බෝග සඳහා වඩාත් ම යෝග්‍ය වාරි ක්‍රමය වන්නේ
   (1) ඇලි හා වැටි ක්‍රමයයි. (2) පිටාර ජල සම්පාදනයයි. (3) බුබුළු ජල සම්පාදනයයි.
   (4) විසුරුම් ජල සම්පාදනයයි. (5) තිරු ජල සම්පාදනයයි.

15. විජලනය කළ දෛහික කලලයක, කැල්සියම් ඇල්ජිනේට් මගින් ආවරණය (encapsulate) කරනු ලැබේ. මෙම ක්‍රියාවලිය හැඳින්වෙන්නේ
   (1) දෙමුහුම් බීජ නිෂ්පාදනය ලෙස ය. (2) කෘත්‍රිම බීජ නිෂ්පාදනය ලෙස ය.
   (3) සහතික කළ බීජ නිෂ්පාදනය ලෙස ය. (4) ආන්තික (terminator) බීජ නිෂ්පාදනය ලෙස ය.
   (5) ජාන විකරණය කළ බීජ නිෂ්පාදනය ලෙස ය.

16. ප්‍රාථමික පස් අංශු ද්විතියික අංශු බවට සකස්වීම හඳුන්වනුයේ
   (1) දෘශ්‍ය ඝනත්වය ලෙස ය. (2) අංශු ඝනත්වය ලෙස ය. (3) පාංශු රූප විද්‍යාව ලෙස ය.
   (4) පාංශු වයනය ලෙස ය. (5) පාංශු ව්‍යුහය ලෙස ය.

www.apepanthiya.lk

ක් මාතෘ ශාකයකින් වර්ධකව ප්‍රචාරණය කර ලබා ගත් ශාක ගහණයක් හොඳින් ම විස්තර කළ හැක්කේ
(1) වසා දර්ශයක් (eco-type) ලෙස ය. (2) වන දර්ශයක් (wild-type) ලෙස ය.
(3) ජෛව දර්ශයක් (bio-type) ලෙස ය. (4) ක්ලෝනයක් (clone) ලෙස ය.
(5) වගා ප්‍රභේදයක් (cultivar) ලෙස ය.

18. ක්විනීන් (Quinine) ලබා ගනුයේ
(1) කෝමාරිකා (*Aloe vera*) වලිනි. (2) දුම්කොළ (*Nicotiana tabacum*) වලිනි.
(3) කොහොඹ (*Azadirachta indica*) වලිනි. (4) සින්කෝනා (*Cinchona ledgeriana*) වලිනි.
(5) මිංචි (*Mentha arnensis*) වලිනි.

19. පාංශු ප්‍රතිරෝධය අඩු කළ හැක්කේ
(1) පාංශු ව්‍යුහය හා වාතනය දියුණු කිරීමෙන් හා පසට කාබනික ද්‍රව්‍ය එකතු කිරීමෙනි.
(2) දෘශ්‍ය ඝනත්වය වැඩි කිරීමෙන් හා පසට රසායනික පොහොර එකතු කිරීමෙනි.
(3) පසේ අංශු ඝනත්වය වැඩි කිරීමෙන් හා පසට ඩොලමයිට් එකතු කිරීමෙනි.
(4) පසෙහි සත්‍ය ඝනත්වය අඩු කිරීමෙන් හා පසට රසායනික පොහොර හා ඩොලමයිට් එකතු කිරීමෙනි.
(5) පස කන්න 2-3 ක් වගා නොකර අතහැර දැමීමෙන් හා භූමිය පිළිස්සීමෙනි.

20. දිගු දිවා ශාක
(1) දිවා කාලය අවධි දිවා දිගට වඩා දීර්ඝ වූ විට මල් හට ගනියි.
(2) දිවා කාලය අවධි දිවා දිගට වඩා කෙටි වූ විට මල් හට ගනියි.
(3) ශ්‍රී ලංකාව වැනි නිවර්තන කලාපීය රටවල දක්නට නොලැබේ.
(4) මල් හටගැනීම සඳහා දීර්ඝ කාලයක් ගනියි.
(5) කෙටි දිවා ශාකවලට සාපේක්ෂ ව දීර්ඝ කාලයක් පුරා මල් හට ගනියි.

21. ආග්නේය පාෂාණ
(1) ප්‍රාථමික පාෂාණ ජීරණය වී, ප්‍රවාහනය වී, නැවත තැන්පත් වීමේ ප්‍රතිඵලයකි.
(2) අවසාදිත පාෂාණ ඉතා අධික පීඩනයකට හා උෂ්ණත්වයකට භාජනයවීමෙන් සෑදේ.
(3) පෘථිවි කබොල්ල සිසිල්වීමෙන් සෑදේ.
(4) අධික බරෙන් යුත් මැටි, අවසාදිත අධික පීඩනයක් යටතේ තද බවට පත්වීමෙන් සෑදේ.
(5) අධික උෂ්ණත්වයකට භාජනය වූ හුනුගල්වලින් සෑදේ.

22. ශාකයක පත්‍ර මත ප්‍රාදේශිකව ඇති වූ වෘත්තාකාර ලප කිහිපයක් තිබෙනු ශිෂ්‍යයෙක් නිරීක්ෂණය කළේ ය. මෙම ලප කහ පැහැති කොළ පැහැයට හුරු දරවලින් වට වූ මැරුණු පටක විය. ඉහත ලක්ෂණ අනුව මෙම තත්ත්වය වඩාත් හොඳින් විස්තර කළ හැක්කේ
(1) කායික විද්‍යාත්මක තත්ත්වයක් ලෙස ය. (2) පෝෂණ ඌනතාවක් ලෙස ය.
(3) බැක්ටීරියා ආසාදනයක් ලෙස ය. (4) දිලීර ආසාදනයක් ලෙස ය.
(5) වයිරස් ආසාදනයක් ලෙස ය.

www.apepathaya.lk

23. මෑතක දී ශ්‍රී ලංකාවේ හඳුනාගත් ආගන්තුක ආක්‍රමණශීලී වල් පැළෑටියකට උදාහරණයක් වනුයේ කුමක් ද?
(1) *Cassia occidentalis* (2) *Parthenium hysterophorus* (3) *Vernonia cinera*
(4) *Acalypha indica* (5) *Cynodon dactylon*

24. හපා කන මුඛ කොටස් සහිත කෘමීන්ගෙන් ශාකයකට සිදුවන ප්‍රධාන හානිය වනුයේ
(1) වයිරස් රෝග සම්ප්‍රේෂණය වීම ය. (2) සෛල යුෂ උරාබීම ය.
(3) බැක්ටීරියා රෝග සම්ප්‍රේෂණය වීම ය. (4) ප්ලෝයම පටක අවහිර කිරීම ය.
(5) ප්‍රභාසංශ්ලේෂක පටක ඉවත්කිරීම ය.

25. අන්තර්-නිවර්තන අභිසාරී කලාපය උතුරට විස්ථාපනය වන්නේ
(1) නිරිත දිග මෝසම් කාලයේ දී ය.
(2) ඊසාන දිග මෝසම් කාලයේ දී ය.
(3) ප්‍රථම අන්තර් මෝසම් (මාර්තු-අප්‍රේල්) කාලයේ දී ය.
(4) දෙවන අන්තර් මෝසම් (ඔක්තෝබර්-නොවැම්බර්) කාලයේ දී ය.
(5) වසරේ වියළි කාලවල දී ය.

26. නවීනතම වර්ගීකරණයට අනුව ශ්‍රී ලංකාවේ කෘෂි පාරිසරික කලාප
(1) 3 ක් තිබේ. (2) 7 ක් තිබේ. (3) 9 ක් තිබේ. (4) 24 ක් තිබේ. (5) 46 ක් තිබේ.

27. හොඳ බෝග සංස්ථාපනයක් සඳහා බීජ සිටුවන ගැඹුර තීරණය කිරීමේ දී සලකා බැලිය යුතු කරුණු වනුයේ
(1) බීජයේ ප්‍රමාණය, සංචිත ආහාර ප්‍රමාණය, බීජාග්‍රපයේ දිග හා පසේ තෙතමන ප්‍රමාණයයි.
(2) බීජයේ ප්‍රමාණය, බීජ පොත්තේ තද බව, බීජ ලපයේ ප්‍රමාණය හා බීජයේ තෙතමන ප්‍රමාණයයි.
(3) බීජයේ හැඩය, වර්ධිකාවේ ප්‍රමාණය, බීජ මූලයේ දිග හා බීජ මූලපයේ ප්‍රමාණයයි.
(4) බීජයේ හැඩය, බීජ පොත්තේ තද බව, බීජ මූලයේ දිග හා බීජයේ තෙතමන ප්‍රමාණයයි.
(5) බීජයේ වර්ණය, අනුද්වාරයේ ප්‍රමාණය, බීජ පත්‍රවල ප්‍රමාණය හා භ්‍රෑණ පෝෂයේ ප්‍රමාණයයි.

28. බීජ සුප්තතාව බිඳ දැමීමේ ක්‍රමවලට උදාහරණ වනුයේ
(1) බීජ ජීවාණුහරණය හා බීජ සීරීමයි.
(2) බීජ ආවරණය කිරීම හා අම්ල ප්‍රතිකාර කිරීමයි.
(3) බීජ දැඩි කිරීම හා උණු ජල ප්‍රතිකාරයයි.
(4) බීජ ජීවාණුහරණය කිරීම හා බීජ ආවරණය කිරීමයි.
(5) බීජ සීරීම හා උණු ජල ප්‍රතිකාරයයි.

29. ශාකවල පැවැත්මට බීජ වැදගත් වනුයේ ඒවායේ ඇති
(1) ව්‍යාප්ත වීමේ හා අහිතකර තත්ත්ව මග හරවා ගැනීමේ හැකියාව නිසා ය.
(2) ව්‍යාප්ත වීමේ හැකියාව හා තද බීජාවරණයක් තිබීම නිසා ය.
(3) අහිතකර තත්ත්ව මග හරවා ගැනීමේ හැකියාව හා දීර්ඝ සුප්ත කාලය නිසා ය.
(4) තද බීජාවරණය හා දීර්ඝ සුප්ත කාලය නිසා ය.
(5) හැඩය, තද බීජාවරණය හා දීර්ඝ සුප්ත කාලය නිසා ය.

30. ශිෂ්‍යයකු විසින් බෝග ශාකයක් මත පහත ලක්ෂණ නිරීක්ෂණය කරන ලදී.
※ පරිණත පත්‍රවල වර්ණය ළා කොළ පැහැයේ සිට කහ පැහැය දක්වා වෙනස් විය.
※ මෙම වර්ණ වෙනස පටකය පුරා ම ඒකාකාර විය.

මෙම තත්ත්වයට හේතුව කුමන මූලද්‍රව්‍යයක ඌනතාව විය හැකි ද?
(1) N (2) Ca (3) Cu (4) Mn (5) Fe

31. වාර්ෂික බෝග සඳහා එප්පාවල රොක් පොස්පේට් නිර්දේශ නොකිරීමට ප්‍රධාන හේතුව
(1) එහි අවශ්‍ය පමණ P_2O_5 අඩංගු නොවීමයි.
(2) එය දේශීය වෙළෙඳපොළෙහි පහසුවෙන් ලබා ගත නොහැකි වීමයි.
(3) එය P_2O_5 සෙමින් නිදහස් කිරීමයි.
(4) එහි අත්‍යවශ්‍ය ක්ෂුද්‍ර පෝෂක අඩංගු නොවීමයි.
(5) එය වාර්ෂික බෝගවලට විෂ වීමයි.

32. ශාක අතු කැබලිවල මුල් ඇද්දවීම පොලිතීන් ගෘහ තුළ දී ඉක්මනින් සිදුවන්නේ ප්‍රධාන වශයෙන්
(1) රෝග හා පලිබෝධවලින් ආරක්ෂා වීම නිසා ය.
(2) ඉහළ ආර්ද්‍රතාව හා උෂ්ණත්වය නිසා ය.
(3) අර්ධ සෙවණ හා ඉහළ උෂ්ණත්වය නිසා ය.
(4) අර්ධ සෙවණ හා ඉහළ ආර්ද්‍රතාව නිසා ය.
(5) වාතයේ CO_2 සාන්ද්‍රණය ඉහළ යාම හා ඉහළ ආර්ද්‍රතාව නිසා ය.

33. හරිතාගාර ආවරණය යොදා ගනිමින්
(1) පොලිතීන් ගෘහ තුළ ඉහළ උෂ්ණත්වයක් පවත්වා ගැනේ.
(2) හරිතාගාරවල ඉහළ ආර්ද්‍රතාවක් පවත්වා ගැනේ.
(3) ලණු ගෘහ තුළ අඩු ආලෝක තීව්‍රතාවක් පවත්වා ගැනේ.
(4) පොලිතීන් ගෘහ තුළ ඉහළ CO_2 සාන්ද්‍රණයක් පවත්වා ගැනේ.
(5) හරිතාගාරවල ඉහළ CO_2 සාන්ද්‍රණයක් පවත්වා ගැනේ.

34. පලතුරු හා එළවලු ශ්‍රේණිගත කිරීමෙන් ඒවායේ
(1) මිල පාලනය කිරීමට හැකි වේ.
(2) මිල ස්ථාවර කිරීමට හැකි වේ.
(3) විකුණුම් මිල වැඩිකරගත හැකි වේ.
(4) වෙළෙඳපොළ ඉල්ලුම අඩු කළ හැකි වේ.
(5) පසු අස්වනු හානි වැඩි වේ.

35. වීවල පසු අස්වනු සැකසීමේ ක්‍රියාවලියේ දී වැඩි ම හානියක් වාර්තා වන්නේ
(1) අස්වනු නෙළීමේ දී ය.
(2) පෑගීමේ (threshing) දී ය.
(3) ගබඩා කිරීමේ දී ය.
(4) වී තැම්බීමේ දී ය.
(5) කෙටීමේ දී ය.

36. දුම් ගැසීමෙන් ගබඩා කාලය (Shelf-life) වැඩි කළ හැක්කේ
(1) ගම්මිරිස්වල ය.
(2) කුරුඳුවල ය.
(3) ගොරකාවල ය.
(4) එණුවල ය.
(5) ඉඟුරුවල ය.

37. සූක්ෂම ලෙස වගා කළ එළවලු වගා බිම්වල ප්‍රධාන භූගත ජල දූෂණ කාරකයක් වන්නේ
(1) පොස්පේට් හා පලිබෝධ නාශක ය.
(2) නයිට්‍රේට් හා පලිබෝධ නාශක ය.
(3) ඇමෝනියම් නයිට්‍රජන් හා පොස්පේට් ය.
(4) කැල්සියම් හා පොස්පේට් ය.
(5) ක්ෂුද්‍ර පෝෂක ය.

www.pepanthiya.lk

සංරක්ෂණ ගොවිතැන ගැන ප්‍රකාශ කිහිපයක් පහත දක්වේ.

A- සංරක්ෂණ ගොවිතැන පලිබෝධ නාශක භාවිත නොකරයි.
B- සංරක්ෂණ ගොවිතැනෙහි ප්‍රධාන පරමාර්ථ වනුයේ පස, ජලය හා ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීමයි.
C- SALT ක්‍රමය සංරක්ෂණ ගොවිතැනට උදාහරණ ලෙස ගත හැකි ය.
D- ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ වඩාත් ජනප්‍රිය ම වගා පද්ධතිය වනුයේ සංරක්ෂණ වගා ක්‍රමයයි.

ඉහත ප්‍රකාශ අතුරෙන් වඩාත් නිරවද්‍ය වනුයේ
(1) A හා B පමණි. (2) B හා C පමණි. (3) C හා D පමණි.
(4) A, B හා C පමණි. (5) A, B, C හා D යන සියල්ල ම.

39. නිෂ්පාදනයේ කෙටි කාල පරිච්ඡේදයක් තුළ වෙනසක් නිරීක්ෂණය කළ හැක්කේ
(1) මුළු වියදම්වල ය. (2) විචල්‍ය වියදම්වල ය. (3) ස්ථාවර වියදම්වල ය.
(4) ස්ථාවර හා මුළු වියදම්වල ය. (5) ස්ථාවර හා විචල්‍ය වියදම්වල ය.

40. රුපියල් 500 ක මාසික සුළු මුදල් ගිණුමක් පවත්වා ගෙන යනු ලබන ගොවිපළක් ජූලි මාසයේ දී ඉන් රුපියල් 350 ක් වියදම් කර ඇත. ජූලි මස අවසානයේ දී බලාපොරොත්තු විය හැක්කේ
(1) රුපියල් 500 ක් එම ගිණුමට බැර කිරීමයි. (2) රුපියල් 500 ක් එම ගිණුමට හර කිරීමයි.
(3) රුපියල් 350 ක් එම ගිණුමට බැර කිරීමයි. (4) රුපියල් 150 ක් එම ගිණුමට බැර කිරීමයි.
(5) ඉදිරි මාසය සඳහා නව ගිණුමක් ඇරඹීමයි.

41. ගොවිපළ නිෂ්පාදනය වැඩි කිරීමේ දී ඒ සඳහා වන සාමාන්‍ය ස්ථාවර වියදම
(1) ක්‍රමයෙන් වැඩි වී ඉන්පසු අඩු වීමට පටන්ගනියි.
(2) ක්‍රමයෙන් අඩු වී ඉන්පසු වැඩි වීමට පටන්ගනියි.
(3) ස්ථාවර ව පවතී.
(4) මුළු ස්ථාවර වියදමට සමාන්තර ව වෙනස් වේ.
(5) ක්‍රමයෙන් අඩු වේ.

42. සමනිෂ්පාදන වක්‍ර සම්බන්ධයෙන් වඩාත් ම නිවැරදි වනුයේ
(1) ඒවායේ බෑවුම ඒකාකාර වීමයි.
(2) සමනිෂ්පාදන වක්‍රයේ ඉහළ කොටසේ දී වැඩි ලාභ ලැබීමයි.
(3) සමනිෂ්පාදන වක්‍රයේ පහළ කොටසේ දී වැඩි ලාභ ලැබීමයි.
(4) සමනිෂ්පාදන වක්‍රය ඔස්සේ ස්ථිර නිෂ්පාදනයක් පෙන්නුම් කිරීමයි.
(5) සාධක සංයෝජනවල තාක්ෂණික සීමා ලබා දීමයි.

43. පාරිභෝගික හැසිරීම පිළිබඳ න්‍යාය වඩාත් වැදගත් වන්නේ එමගින්
(1) භාණ්ඩ මිලට ගන්නා ප්‍රමාණය දක්වන බැවිනි.
(2) නිෂ්පාදන සාධක යෙදවිය යුතු ආකාරය පෙන්නුම් කරන බැවිනි.
(3) පාරිභෝගික ඉල්ලුම් වක්‍රයක් නිර්මාණය කළ හැකි බැවිනි.
(4) X_1 හා X_2 භාණ්ඩ දෙකෙහි යෙදවුම් සංයෝජන දක්වන බැවිනි.
(5) X_1 හා X_2 භාණ්ඩ දෙකෙහි ලාභ උපරිම කෙරෙන සංයෝජනය දක්වන බැවිනි.

44. එළදෙනකගේ කිරි එරීමට දායක වන ප්‍රධාන හෝර්මෝනය වනුයේ
(1) ටෙස්ටෙස්ටරෝන් ය. (2) ප්‍රොජෙස්ටරෝන් ය. (3) ඔක්සිටෝසින් ය.
(4) ඊස්ට්‍රජන් ය. (5) ප්‍රෝලැක්ටින් ය.

45. ගොවිපළ සතුන්ගේ බුරුලු ප්‍රදාහය (Mastitis) සාදනුයේ
(1) වයිරස් විසිනි. (2) බැක්ටීරියා විසිනි. (3) දිලීර විසිනි.
(4) මයිටාවන් විසිනි. (5) කිණිතුල්ලන් විසිනි.

46. කුකුළන්ගේ ගම්බෝරෝ රෝගය සාදනුයේ
(1) වයිරස් විසිනි. (2) බැක්ටීරියා විසිනි. (3) දිලීර විසිනි.
(4) මයිටාවන් විසිනි. (5) කිණිතුල්ලන් විසිනි.

47. අත්‍යවශ්‍ය මේද අම්ල වනුයේ
(1) ලිනොලෙයික්, ඔලෙයික් සහ ලෝරික් අම්ලයි.
(2) ලිනොලෙයික්, ලිනොලෙනික් සහ ඇරචිඩික් අම්ලයි.
(3) ලිනොලෙයික්, ලිනොලෙනික් සහ ඇරචිඩොනික් අම්ලයි.
(4) ලිනොලෙනික්, ඇරචිඩොනික් සහ ස්ටියරික් අම්ලයි.
(5) ලිනොලෙයික්, ඇරචිඩොනික් සහ ලෝරික් අම්ලයි.

48. මේද ද්‍රාව්‍ය විටමින වනුයේ
(1) A, B, C සහ D ය. (2) A, C, D සහ E ය. (3) C, D, E සහ K ය.
(4) B, D, E සහ K ය. (5) A, D, E සහ K ය.

www.apepanthiya.lk

49. මුදවන ලද කිරිවල නිපදවෙන ප්‍රධාන අම්ලය වනුයේ
(1) ප්‍රොපියොනික් ය. (2) ලැක්ටික් ය. (3) ඇසිටික් ය.
(4) සිට්රික් ය. (5) බියුට්රික් ය.

50. එළකිරිවල (Cow milk) අඩංගු ප්‍රෝටීන ප්‍රමාණය වනුයේ
(1) 2.0% - 2.5% (2) 3.0% - 3.5% (3) 4.0% - 4.5%
(4) 5.0% - 5.5% (5) 6.0% - 6.5%

51. ක්‍රීප් ෆීඩ (Creep Feed) දෙනුයේ
(1) දිනක් වයසැති කුකුළු පැටවුන්ට ය. (2) වසු පැටවුන්ට ය. (3) එළු පැටවුන්ට ය.
(4) පට්ටි ඌරන්ට ය. (5) කුඩා ඌරු පැටවුන්ට ය.

52. කිකිළි බිත්තරයක බීජෞෂණ කාලය
(1) දින 15 කි. (2) දින 18 කි. (3) දින 21 කි.
(4) දින 24 කි. (5) දින 28 කි.

53. එළුදෙනකගේ ගර්භිණී කාලය හා එළදෙනකගේ ගර්භිණී කාලය පිළිවෙළින්
(1) මාස 3 ක් හා මාස 7 කි. (2) මාස 4 ක් හා මාස 7 කි. (3) මාස 5 ක් හා මාස 9 කි.
(4) මාස 6 ක් හා මාස 9 කි. (5) මාස 9 ක් හා මාස 12 කි.

54. රජයේ කෘත්‍රිම සිංචන මධ්‍යස්ථාන පිහිටා ඇති ස්ථාන වනුයේ
(1) පොළොන්නරුව, කුණ්ඩසාලේ සහ තින්නවෙලි ය.
(2) පොළොන්නරුව, කුණ්ඩසාලේ සහ යාපනය ය.
(3) මහනුවර, කුණ්ඩසාලේ සහ තින්නවෙලි ය.
(4) නුවරඑළිය, කුණ්ඩසාලේ සහ තින්නවෙලි ය.
(5) නුවරඑළිය, කුණ්ඩසාලේ සහ යාපනය ය.

55. ආහාර සංරක්ෂණයේ ප්‍රධාන පරමාර්ථ වනුයේ
A- මිල විචලතා අවම කිරීමයි.
B- ආහාරයට කෘත්‍රිම ද්‍රව්‍ය එකතු කිරීමයි.
C- අතිරික්ත නිෂ්පාදනය ලාභදායී ආකාරයකට යොද ගැනිමයි.
ඉහත ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි වනුයේ
(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A හා B පමණි. (5) A හා C පමණි.

56. වැලි පසකට කාබනික ද්‍රව්‍ය එකතු කිරීමෙන්
(1) කැටායන හුවමාරු ධාරිතාව අඩු වේ. (2) ජලවහනය දියුණු වේ.
(3) පාංශු ව්‍යුහය විනාශ වේ. (4) ජලය රඳ ගැනීමේ ධාරිතාව වැඩි වේ.
(5) පාංශු ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරිත්වය අඩු වේ.

57. බහුලව යොද ගැනෙන කෘෂිකාර්මික බෝග බොහොමක් සඳහා උචිත පාංශු pH පරාසය වනුයේ
(1) 4.5 ට අඩු වීම ය. (2) 4.5 හා 6.5 අතර වීම ය. (3) 6.5 හා 7.0 අතර වීම ය.
(4) 7.0 හා 8.0 අතර වීම ය. (5) 8.0 ට වැඩි වීම ය.

58. නගුල බහුල ව යොද ගැනෙනුයේ
(1) අතුරු යත්ගෑමේදී ය. (2) ප්‍රාථමික බිම් සැකසීමේ දී ය.
(3) ද්විතීයික බිම් සැකසීමේ දී ය. (4) ශුන්‍ය බිම් සැකසීමේ දී ය.
(5) අවම බිම් සැකසීමේ දී ය.

59. බෑවුම් සහිත භූමියක සමෝච්ච රේඛා සටහන් කිරීමට වඩාත් උචිත උපකරණය වනුයේ
(1) දම්වැල (chain) ය. (2) U නළය ය. (3) A රාමුව ය.
(4) මනින පටිය ය. (5) ප්ලැනි මීටරය (planimeter) ය.

60. සත්ත්ව ආහාර සඳහා සහල් නිවුඩු (rice polish) යොද ගැනෙන්නේ
(1) ශක්ති පරිපූරකයක් ලෙස ය. (2) ප්‍රෝටීන පරිපූරකයක් ලෙස ය.
(3) ඛනිජ පරිපූරකයක් ලෙස ය. (4) විටමින පරිපූරකයක් ලෙස ය.
(5) කාබොහයිඩ්රේට පරිපූරකයක් ලෙස ය.

☆ ☆ ☆

www.apepanthiya.lk

කෘෂි විද්‍යාව II - පැය තුනයි

වැදගත් : ✻ මෙම ප්‍රශ්න පත්‍රය A සහ B යන කොටස් දෙකකින් යුක්ත වේ. කොටස් දෙකට ම නියමිත කාලය පැ තුනකි.

A කොටස - ව්‍යුහගත රචනා
සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු, මෙම පත්‍රයේ ම සපයන්න. ඔබේ පිළිතුරු ප්‍රශ්න පත්‍රයේ ඉඩ සලසා ඇති තැන්වල ලිවිය යුතු ය. මේ ඉඩ ප්‍රමාණය පිළිතුරු ලිවීමට ප්‍රමාණවත් බව ද දීර්ඝ පිළිතුරු බලාපොරොත්තු නොවන බව ද සලකන්න.

B කොටස - රචනා
ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න. මේ සඳහා සපයනු ලබන කඩදාසි පාවිච්චි කරන්න. සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු "A" සහ "B" කොටස් එක් පිළිතුරු පත්‍රයක් වන සේ "A" කොටස උඩින් තිබෙන පරිදි අමුණා, විභාග ශාලාධිපතිට භාර දෙන්න.
ප්‍රශ්න පත්‍රයේ "B" කොටස පමණක් විභාග ශාලාවෙන් පිටතට ගෙන යාමට ඔබට අවසර ඇත.

A කොටස - ව්‍යුහගත රචනා

සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
(එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 10 කි.)

1. (A) බෝග ශාකවල දක්නට ලැබෙන පුෂ්ප විකරණ සමහරක් පහත දක්වා ඇත. එක් එක් විකරණය සඳහා වඩාත් ගැළපෙන් පරාගන ආකාරය (ස්වපරාගනය ද පරපරාගනය ද යන වග) දක්වන්න.

	පුෂ්ප විකරණය	පරාගන ආකාරය
(i)	ප්‍රජායා පරිණතිය	
(ii)	ද්විලිංගික පුෂ්ප	
(iii)	ප්‍ර පුංපරිණතිය	
(iv)	ද්වි ගෘහීයතාව	
(v)	විෂම කීලකතාව	
(vi)	නිමීලයෝගීතාව	

www.apepanthiya.lk

(B) ගොවියෙක් ඔහුගේ කුඹුරෙන් ගත් පස් නියැදියක් පරීක්ෂා කරන ලදුව එහි ඇති ලබාගත හැකි නයිට්‍රජන් ප්‍රමාණය 107 kg/ha බව සොයාගත්තේය. ඔහු එම කුඹුරෙහි වී වගා කර ඇත. වී වගාව සඳහා නයිට්‍රජන් අවශ්‍යතාව 207 kg/ha වේ. නයිට්‍රජන්වල පොහොර කාර්යක්ෂමතාව 50% ලෙස උපකල්පනය කරන්න.

(i) ඔහුගේ කුඹුරට යෙදිය යුතු යූරියා පොහොර ප්‍රමාණය (kg/ha) ගණනය කරන්න.

....

....

....

(ii) පොහොර කාර්යක්ෂමතාව අර්ථ දක්වන්න.

....

....

....

(iii) බෝගයක පොහොර කාර්යක්ෂමතාව දියුණු කිරීමට යොදගත හැකි ක්‍රම තුනක් දක්වන්න.

1. ....
2. ....
3. ....

(iv) බෝග ක්ෂේත්‍රවල රසායනික පොහොර භාවිත කිරීමේ ප්‍රධාන අවාසි තුනක් නම් කරන්න.

1. ....
2. ....
3. ....

(C) (i) පහත දෑ අර්ථ දක්වන්න.

1. වාර්ෂික වල් පැළෑටි

...

2. ද්විවාර්ෂික වල් පැළෑටි

...

3. බහුවාර්ෂික වල් පැළෑටි

...

(ii) වල් පැළ පාලනය පිළිබඳ නවීන ක්‍රමවල දී "වල් පැළ ප්‍රයෝජනවත් ලෙස භාවිත කිරීම" සාර්ථක වල් පැළ පාලන ක්‍රමයක් ලෙස සැලකේ. වල් පැළවල විවිධ භාවිත තුනක් ලැයිස්තුගත කරන්න. එක එකක් සඳහා උදාහරණය බැගින් දෙන්න.

	භාවිතය	උදාහරණය
1.	...	...
2.	...	...
3.	...	...

(iii) රසායනික නොවන කෘමි පලිබෝධ පාලන ක්‍රම තුනක් ලැයිස්තුගත කරන්න.

1. ...
2. ...
3. ...

(iv) දියර පලිබෝධ නාශක ඉසිනවල ප්‍රධාන ආකාර දෙකක් ලැයිස්තුගත කරන්න.

1. ...
2. ...

www.apepanthiya.lk

2. (A) අංක (i) සිට (iii) තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත රූප සටහන යොදා ගන්න.



(i) රූප සටහන හඳුනාගන්න.

...

(ii) පහත සඳහන් කොටස් නම් කරන්න.

P. ...
Q. ...
R. ...
S. ...
T. ...

(iii) ඉහත රූප සටහනෙහි දී ඇති, පහත සඳහන් එක් එක් කොටසෙහි ප්‍රධාන කාර්යය දක්වන්න.

P. ...
Q. ...
R. ...
S. ...
T. ...

(B) ශිෂ්‍යයෙක් එක් පෝච්චියක එක් මිරිස් පැළයක් බැගින් අඩංගුවන පෝච්චි හතරක් තෝරා ගත්තේය. මෙහි දී ඔහු එකම ප්‍රමාණයෙන් හා එකම වයසෙන් යුත් මිරිස් පැළ අඩංගු එකම ප්‍රමාණයේ පෝච්චි තෝරා ගැනීමට පරෙස්සම් විය. ඔහු මෙම පෝච්චිවලට හොඳින් ජලය යොද වැඩිපුර ජලය වහනය වූ පසු පෝච්චියේ මතුපිට ද හොඳින් වැසෙන සේ කළු පොලිතීන්වලින් ආවරණය කර මුද්‍රා තැබීය. කෙසේ වෙතත් මිරිස් ශාකයේ වායව කොටස් ආවරණය නොකිරීමට ඔහු වග බලා ගත්තේය. ඉන්පසු ඔහු එක් එක් පෝච්චියේ බර මැන්නේය. නැවත දින හතරකට පසු එක් එක් පෝච්චියේ බර මැන්නේය. පහත වගුවේ එම දත්ත දී ඇත.

මිනුම	පෝච්චි - 1	පෝච්චි - 2	පෝච්චි - 3	පෝච්චි - 4
පෝච්චියේ ආරම්භක බර (g)	5950	6025	6125	5975
දින හතරකට පසු පෝච්චියේ බර (g)	4670	4765	4885	4675
බරෙහි වෙනස (g)	1280	1260	1240	1300

(i) මිරිස්වල උත්ස්වේදන සීඝ්‍රතාව දිනකට ශාකයකට ග්‍රෑම්වලින් ගණනය කරන්න.

....

....

....

(ii) මෙම පරීක්ෂණය සඳහා පෝච්චි හතරක් යොද ගැනීමේ අරමුණ කුමක් ද?

....

....

(iii) ඔහු කළු පොලිතීන්වලින් පෝච්චි ආවරණය කළේ ඇයි?

....

....

(iv) මෙම පර්යේෂණයේ මිනුම්වලට බලපෑම් කළ හැකි කායික විද්‍යාත්මක ක්‍රියාවලි දෙකක් නම් කරන්න.

1. ....

2. ....

(v) ප්‍රතිඋත්ස්වේදනකාරක ආකාර තුනක් ලැයිස්තුගත කරන්න.

1. ....

2. ....

3. ....

www.apepanthiya.lk

(C) පාසලේ කෘෂි විද්‍යාගාරයේ බීජ තොගයක් තිබෙනු ශිෂ්‍යයෙක් දුටුවේය. ඔහුට මෙම බීජවල ජීව්‍යතාව පරීක්ෂා කිරීමට අවශ්‍ය විය.

(i) ඉහත සඳහන් බීජ තොගයේ ජීව්‍යතාව පරීක්ෂා කිරීම සඳහා සුදුසු ක්‍රමයක් නම් කරන්න.

....

(ii) බීජ ජීව්‍යතාවට බලපාන ප්‍රධාන සාධක තුනක් ලැයිස්තුගත කරන්න.

1. ....

2. ....

3. ....

(iii) ප්‍රධාන බීජ සුප්තතා ආකාර දෙකක් නම් කරන්න.

1. ....

2. ....

3. (A) තෙත් කලාපයේ ඉඩමක් හිමි ගොවියෙක් ඔහුගේ ඉඩමෙහි පස ආම්ලික බව දැනගත්තේ ය.

(i) ඔහුගේ ඉඩමේ පස ආම්ලිකවීමට බලපාන එක් ප්‍රධාන හේතුවක් දක්වන්න.

....

(ii) පාංශු ආම්ලිකතාව අඩු කිරීමට පසට එකතු කළ හැකි ආකලන ද්‍රව්‍ය තුනක් නම් කරන්න.

1. ....

2. ....

3. ....

(iii) ශ්‍රී ලංකාවේ තෙත් කලාපීය පස් සඳහා ඇමෝනියම් සල්ෆේට් පොහොර නිර්දේශ නොකෙරෙන්නේ මන්ද?

....

(B) ප්‍රධාන බෝග සංස්ථාපන ක්‍රම තුනක් ලැයිස්තුගත කරන්න.

1. ....

2. ....

3. ....

(C) අංක (i) සිට (iv) තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත රූප සටහන උපයෝගී කර ගන්න.



(i) අපාරගම්‍ය ස්ථරය කුමක් ද?

....

(ii) ආටීසියානු ජල සංචායකය (acquifer) කුමක් ද?

....

(iii) අඛණ්ඩව ජලය පිටාර ගලන ළිඳ කුමක් ද?

....

(iv) පොළොව මතුපිට සිට වඩාත් ම ගැඹුරින් ජල මට්ටම පිහිටා ඇති ළිඳ නම් කරන්න.

....

(D) (i) පාලිත තත්ත්ව යටතේ බෝග වගා කිරීමේ ප්‍රධාන වාසි තුනක් ලැයිස්තුගත කරන්න.

1. ....

2. ....

3. ....

(ii) ශ්‍රී ලාංකීය තත්ත්ව යටතේ පොලිතීන් උමං, හරිතාගාරවලට වඩා ජනප්‍රිය ඇයි? හේතු තුනක් දක්වන්න.

1. ....

2. ....

3. ....

(E) (i) 'ආන්තික නිෂ්පාදනය' අර්ථ දක්වන්න.

....

....

(ii) පහත සඳහන් රූප සටහන, ගොවිපළක කිරි නිෂ්පාදනය සඳහා වූ සැකසීමේ ඒකකයක වියදම් වක්‍ර තුනක් නිරූපණය කරයි.



www.apepanthiya.lk

(a) වක්‍ර නම් කරන්න.
A. ....
B. ....
C. ....

(b) ලාභ උපරිම කෙරෙන ලක්ෂ්‍යය කුමක් ද?
....

(c) ලාභ උපරිම කෙරෙන අවස්ථාවේ දී නිෂ්පාදනය කොපමණ ද?
....

(d) එම අවස්ථාවේ දී වෙළෙඳපොළ මිල කුමක් ද?
....

4. (A) පහත දැක්වෙන රූප සටහනෙහි *A, B, C, D* හා *E* මගින් පෙන්වා ඇති කොටස් නම් කරන්න.



	කොටස	කොටසෙහි නම
(i)	A	
(ii)	B	
(iii)	C	
(iv)	D	
(v)	E	

www.apepanthiya.lk

(B) පහත සඳහන් ආහාර සංඝටකවල ප්‍රෝටීන් ප්‍රමාණය

	ආහාර සංඝටකය	ප්‍රෝටීන් %
(i)	බඩ ඉරිඟු	
(ii)	පොල් පුන්නක්කු	
(iii)	සෝයා බෝංචි අන්නය	
(iv)	මාළු අන්නය	
(v)	හාල් නිවුඩු	

(C) පහත දැක්වෙනුයේ ගවයකුගේ ප්‍රජනක පද්ධතිය සම්බන්ධ රූප සටහනකි. එහි A, B, C, D සහ E මගින් නිරූපණය කර ඇති කොටස් නම් කර, එම එක් එක් කොටස ම ගින් ඉටුවන ප්‍රධාන කාර්යය ද සඳහන් කරන්න.



	කොටස	කොටසේ නම	ප්‍රධාන කාර්යය
(i)	A		
(ii)	B		
(iii)	C		
(iv)	D		
(v)	E		

(D) ආහාර සංරක්ෂණය කෙරෙන ප්‍රධාන ක්‍රම පහක් ලැයිස්තුගත කරන්න.

(i) ....

(ii) ....

(iii) ....

(iv) ....

(v) ....

www.apepanthiya.lk

☆ ☆ ☆

B කොටස - රචනා

☆ ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.
අවශ්‍ය තැන්හි දී නම් කරන ලද පැහැදිලි රූප සටහන් දෙන්න.
(එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 15 කි.)

---

1. (i) කෘෂි කාලගුණික මධ්‍යස්ථානයක දත්ත ලබාගන්නා ආකාරය හා ලේඛනගත කරන ආකාරය පැහැදිලි කරන්න.
   (ii) කොම්පෝස්ට් සෑදීමේ ප්‍රධාන පියවර විස්තර කරන්න.
   (iii) ආහාර අධිශීතකරණය කිරීමේ වාසි හා අවාසි දක්වන්න.

2. (i) හොඳින් සැකසූ පසක ලක්ෂණ කවරේ ද?
   (ii) ජෛව විද්‍යාත්මක පලිබෝධ පාලනයේ වැදගත්කම විස්තර කරන්න.
   (iii) ශ්‍රී ලංකාවේ ජාතික වී අස්වැන්න පසුගිය දශකය තුළ ස්ථාවර තත්ත්වයක් පෙන්වයි. ඉහත තත්ත්වය ඇතිවීමට බලපෑ හේතු විස්තර කර, එය මඟහරවා ගත හැකි ක්‍රම සඳහන් කරන්න.

3. (i) වාරි කාර්යක්ෂමතාවට (irrigation efficiency) බලපාන සාධක කවරේ ද?
   (ii) පාංශු ජනනයට උපකාරීවන දේශගුණික සාධකවල කාර්යභාරය පැහැදිලි කරන්න.
   (iii) Y නිෂ්පාදනය සඳහා X_1 හා X_2 නම් වූ සම්පත් අවශ්‍ය වේ නම් ගොවිපළ කළමනාකරුවකු මෙම සම්පත් දෙක ප්‍රශස්තව භාවිතය පිළිබඳ ව තීරණය කරන්නේ කෙසේ ද?

4. (i) පැහැදිලිව නම් කළ රූප සටහනක් ආධාරයෙන්, ද්විබීජපත්‍රී බීජයක එක් එක් කොටසේ ප්‍රධාන කාර්යය විස්තර කරන්න.
   (ii) ශාකවල පැවැත්ම සඳහා ජලයේ වැදගත්කම විස්තර කරන්න.
   (iii) කිකිළියකගේ ප්‍රජනක පද්ධතිය තුළ බිත්තරයක් සෑදීමේ ක්‍රියාවලිය පැහැදිලි කරන්න.

5. (i) හේන් ගොවිතැනෙහි වාසි හා අවාසි විස්තර කරන්න.
   (ii) තාක්ෂණයේ දී භාවිත වන විවිධ ආකාරයේ තාවකාලික ප්‍රචාරක ව්‍යුහ විස්තර කරන්න.
   (iii) ගවයින්ගේ සංකීර්ණ ආමාශය තුළ දළ තන්තු ජීරණයවීම පැහැදිලි කරන්න.

6. (i) පටක රෝපණ විද්‍යාගාරයක මූලික අවශ්‍යතා කවරේ ද?
   (ii) පාරිසරික තුලනය පවත්වා ගැනීම සඳහා කෘෂි වන වගාවෙහි කාර්යභාරය විස්තර කරන්න.
   (iii) ගොවිපළ සතුන්ගේ මද ලක්ෂණ විස්තර කරන්න.

☆ ☆ ☆

www.apepanthiya.lk